**සියළුම හිමිකම් ඇවිරිණි**

**2014 සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය පෙරහුරු ප්‍රශ්න පත්‍රය I, II**

සැලකිය යුතුයි:- කාලය පැය 03

- සියළුම ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

01. "ව්‍යවසායකත්වය" වඩාත් හොඳින් පැහැදිලි කෙරෙන ප්‍රකාශය තෝරන්න.

i. සම්පත් උපයෝගී කරගෙන නිමැවුමක් බිහි කිරීම
ii. ව්‍යාපාර අවදානම් භාරගැනීම
iii. ව්‍යාපාරික අවස්ථාවන් ග්‍රහණය කරගෙන නව නිපැයුම් බිහි කිරීම
iv. නිෂ්පාදන සාධක කළමනාකරණය කිරීම

02. පහත දැක්වෙන්නේ ව්‍යවසායකත්වය සංවර්ධනය වීම කෙරෙහි ඇති අභියෝග සඳහා නිදසුන් කිහිපයකි.

**A - ආවේණික අලසකම B - පුද්ගල ආකල්ප C - උත්තේජනයක් නොමැති වීම**
**D - විශ්වාස E - සිතුවිලි රටාව F - පරම්පරාගත දෑ**

**ඒවායෙන් මනෝවිභීතිය (Mindset) නැමති අභියෝගයට අදාළ නිදසුන් පමණක් ඇති පිළිතුර තෝරන්න.**

i. **A, D, E**
ii. **B, E, F**
iii. **A, C, E**
iv. **B, C, E**

03. කුඩා ව්‍යාපාර ලෙස තීරණය කිරීම සඳහා යම් යම් ආයතන විවිධ නිර්ණායක යොදාගනී. "භාවිත වන විදුලිබලධාරිතාව කිලෝවොට් ඇම්පියර් 50ට අඩු වීම" කුඩා ව්‍යාපාර ලෙස සැලකීමට යොදා ගන්නේ;

i. ශ්‍රී ලංකා මහ බැංකුව යි.
ii. කාර්මික සංවර්ධන අධිකාරිය යි.
iii. කාර්මික තාක්ෂණ ආයතනය යි.
iv. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යි.

04. ව්‍යවසායකයින් බිහිවීම කෙරෙහි පවතින අදහස් විවාදිතය.ව්‍යවසායකත්ව පසුබිම කෙරෙහි සැලකිලිමත් වන කරුණු පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

i. යහළුවන්, පවුල, පාසල, රැකියාව, විනෝදාංශ
ii. යහළුවන්, අධ්‍යාපනය, රැකියාව, පවුල, විනෝදාංශ
iii. පවුල, අධ්‍යාපනය, පළපුරුද්ද, වයස, විනෝදාංශ
iv. පාසල, රැකියාව, යහළුවන්, අධ්‍යාපනය, විනෝදාංශ

05. පහත වගුවේ ව්‍යවසායකත්වයේ සාර්ථකත්වයට ඉවහල්වන සාධක සහ එම සාධකවලදී සැලකිලිමත් විය යුතු කරුණු දැක්වේ.

| ව්‍යවසායකයින්ගේ සාර්ථකත්වයට ඉවහල්වන සාධක | සැළකිලිමත් විය යුතු කරුණු |
|---|---|
| 1. සම්පත් කළමනාකරණය<br>2. පිරිවැය පිළිබඳව සැලකිලිමත් වීම<br>3. ගනුදෙනුකරු පිළිබඳ සැළකිලිමත් වීම<br>4. යෝග්‍ය ස්ථානගත කිරීම<br>5. වාර්තා තබා ගැනීම | A. තෘප්තිමත් කිරීම<br>B. සම්පත් ලබා ගැනීමේ හා වෙළෙඳපොලට පිවිසීමේ පහසුව<br>C. තීරණ ගැනීම පහසු වීම<br>D. භෞතික, මානව, මූල්‍ය<br>E. පාලනය කිරීම |

ඉහත වම්පස තීරුවේ හා දකුණුපස තීරුවේ ඇති කරුණු නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

i. 1-D, 2-E, 3-A, 4-B, 5-C
ii. 1-E, 2-D, 3-B, 4-C, 5-A
iii. 1-A, 2-B, 3-C, 4-D, 5-E
iv. 1-B, 2-E, 3-D, 4-C, 5-A

06. ව්‍යවසායකයෙකු සතුව පැවතිය යුතු කුසලතා පමණක් ඇති පිළිතුර තෝරන්න.

i. තාක්ෂණික කුසලතා, නායකත්ව කුසලතා, තීරණ ගැනීමේ කුසලතා
ii. නායකත්ව කුසලතා, මානව සම්බන්ධතා කුසලතා, කළමනාකරණ කුසලතා
iii. තාක්ෂණික කුසලතා, මානව සම්බන්ධතා කුසලතා, මනෝභාවාත්මක කුසලතා
iv. මනෝභාවාත්මක කුසලතා, කළමනාකරණ කුසලතා, තීරණ ගැනීමේ කුසලතා

07. යම් කිසි කරුණු කිහිපයක් රැකියා, වෘත්තීන් හා ව්‍යවසායකත්වය අතර වෙනස් වන ආකාරය පහත වගුවේ දැක්වේ.

| | රැකියා | වෘත්තීන් | ව්‍යවසායකත්වය |
|---|---|---|---|
| 1. නිශ්චිත අධ්‍යාපන සුදුසුකම් | අවශ්‍ය වේ | අවශ්‍ය වේ | අවශ්‍යම නොවේ |
| 2. ලැබෙන ප්‍රතිලාභ | වැටුප්/වේතන | දීමනා/ ගාස්තු | ලාභ |
| 3. ආයෝජනය | අවශ්‍ය නොවේ | අවශ්‍ය නොවේ | අවශ්‍ය වේ |
| 4. මානසික තෘප්තිය | අඩුය | අඩුය | අඩුය |

වෙනස්වන ආකාරය **වැරදි ලෙස** දක්වා ඇති කරුණ වන්නේ

i. නිශ්චිත අධ්‍යාපන සුදුසුකම් ය.
ii. ලැබෙන ප්‍රතිලාභය ය.
iii. ආයෝජනය ය.
iv. මානසික තෘප්තිය ය.

08. ව්‍යවසායකයෙකුට විවිධ භූමිකා යටතේ විවිධ කටයුතු කිරීමට සිදු වේ. “අයිතිකරු” (සේව්‍යයා) යන භූමිකාවට අයත් කාර්යයන් ඇති පිළිතුරු වන්නේ

i. සම්පත් සැපයීම, මෙහෙයවීම හා සැලසුම් කිරීම ය.
ii. මෙහෙය වීම, සන්නිවේදනය හා තීරණ ගැනීම ය.
iii. සම්පත් සැපයීම, අවදානම් දැරීම හා ප්‍රතිලාභ භුක්ති විඳීම ය.
iv. සැලසුම්කිරීම, අවදානම් දැරීම හා සන්නිවේදනය ය.

09. ව්‍යවසායකත්වය සතු පාරිභෝගික වගකීමේදී පාරිභෝගිකයන් තෘප්තිමත් කිරීම පමණක් අදහස් නොකරයි. පාරිභෝගික වගකීමට අදාළ අනෙක් කරුණු වන්නේ

i. අවංක වීම, සාධාරණ වීම හා ගෞරව කිරීම ය.
ii. අවංක වීම, අවබෝධයෙන් යුතු වීම හා වගකීම් දැරීම ය.
iii. සාධාරණ වීම, වගකීම් සහිත වීම හා අවබෝධයෙන් යුක්ත වීම ය.
iv. ගෞරව කිරීම, අවබෝධයෙන් යුතු වීම හා වගකීම් සහිත වීම ය.

10. ශ්‍රී ලංකා මහ බැංකුව වර්ග කර ඇති ආකාරයට අනුව “ කර්මාන්ත අංශය ” සමන්විත වන ක්ෂේත්‍ර කිහිපය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

i. නිමැවුම් කර්මාන්ත, ගැලපුම්, පෙරළුම්, ඉදිකිරීම්.
ii. පතල් හා කැණීම්, ගැලපුම්, පෙරළුම්, ඉදිකිරීම්.
iii. පතල් හා කැණීම්, නිමැවුම් කර්මාන්ත, විදුලිය සහ ජලය, ඉදි කිරීම.
iv. විදුලිය හා ජලය, ඉදිකිරීම, ගැලපුම්, නිමැවුම්.

11. කිසියම් ආයතනයක් අනාගතයේ කවර තත්වයකට පත් වන්නේ ද යන්න ප්‍රකාශ වන්නේ
i. දැක්ම මගිනි.
ii. මෙහෙවර මගිනි.
iii. ඉලක්ක මගිනි.
iv. පරමාර්ථ මගිනි.

12. ව්‍යවසායකයා තම අරමුණු ඉටු කර ගැනීමට යාමේදී පරිසරයෙන් ඇති වන බාධා සලකන්නේ
i. අවස්ථා ලෙසයි .
ii. අභියෝග ලෙසයි.
iii. ශක්තීන් ලෙසයි.
iv. දුර්වලතා ලෙසයි.

13. කිසියම් කාර්යයක් සඳහා නිශ්චිත අදහසක් හෝ විසඳුමක් ලබා ගැනීම සඳහා සියළු පාර්ශවයන්ගේ අදහස් ලබා ගනිමින් කටයුතු කිරීම
i. දූරදර්ශී චින්තනය ලෙස හඳුන්වයි.
ii. කළමනාකරණය ලෙස හඳුන්වයි.
iii. සහයෝගීතාවය ලෙස හඳුන්වයි.
iv. බුද්ධි කලම්බනය ලෙස හඳුන්වයි.

14. ගැටළු විසඳීම සඳහා තීරණ ගැනීමේ “ විද්‍යානුකූල ක්‍රමයේ ” පියවර පහත දැක්වේ.
A - ගැටලු විසඳීම හා විභව විසඳුම් තීරණ කිරීම.
B - ප්‍රධාන ගැටලුව හඳුනාගැනීම හා ඒවාට හේතු නිශ්චය කිරීම
C - හොඳම විසඳුම තෝරා ගැනීම.
D - විභව විසඳුම් ඇගයීම.

මෙම ක්‍රියාවලිය නිවැරදි අනුපිළිවෙළ වන්නේ

i. B, A, C, D ය.
ii. B, A, D, C ය.
iii. A, B, D, C ය.
iv. A, C, B, D ය.

15. සන්නිවේදන ක්‍රම විවිධය.“විද්‍යුත් වාචික” සන්නිවේදන ක්‍රමයක් වන්නේ
i. විදුලි පණිවිඩ ය.
ii. රැස්වීම් ය.
iii. විදුලි සීනුව ය .
iv. දුරකථන ය.

16. පුද්ගලයන්ට ජීවත්වීම සඳහා අනිවාර්යයෙන්ම සපුරාගත යුතු මූලික තෘප්තීන් හැඳින්වෙන්නේ

i. අවශ්‍යතා ලෙසය.
ii. වුවමනා ලෙසය.
iii. භාණ්ඩ ලෙසය.
iv. සේවා ලෙසය.

17. දසුන් සමාගම අල්මාරි නිෂ්පාදනය කරයි. ඔවුන්ගේ අල්මාරි මිලදී ගන්නන් පිරිස දසුන් සමාගමේ

i. සැපයුම්කරුවන් ය .
ii. වෙළෙඳපොළ ය .
iii. අතරමැදියන් ය .
iv. පසුපස ව්‍යාපාරිකයන් ය .

18. නිෂ්පාදිතයේ ගුණාත්මක බව, ඒ තුළින් ලබා දෙන ප්‍රතිලාභ හා මිල යන කරුණු මත ප්‍රධාන වශයෙන් තීරණය වන්නේ එම නිෂ්පාදිතයේ

i. නිෂ්පාදන පිරිවැය ය.
ii. වටිනාකම ය.
iii. තරඟකරුවන්ගේ මිල ගණන් ය.
iv. බෙදා හැරීම් මාර්ගය ය.

19. දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කර ගැනීම, පාඨමාලා හැදෑරීම, දේශන හා වැඩ මුළුවලට සහභාගී වීම තුළින් සංවර්ධනය කර ගත හැක්කේ

i. ව්‍යාපාර අදහස් ය .
ii. ව්‍යාපාර අවස්ථා ය .
iii. පුද්ගල විභව්‍යතාවන් ය .
iv. ව්‍යාපාර ශක්තීන් ය .

20. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. ජනමාධ්‍ය මගින් ලබා දෙන තොරතුරු ව්‍යාපාර අදහස් පහළ වීමට පදනම් වන පුද්ගල සාධකයක් නොවේ.
ii. සෑම ව්‍යාපාර අදහසක්ම සාර්ථක වේ.
iii. රැකියාවක නිරත වීමෙන් ලබන අත්දැකීම් ව්‍යාපාර ආරම්භ කිරීමට බලපාන බාහිර උත්තේජනයකි.
iv. මිනිස් අවශ්‍යතා සපුරාලන නිර්මාණ ඉදිරිපත් කිරීමට පුද්ගලයන් හෝ ආයතන ඉදිරිපත් කරන සංකල්පනා ව්‍යාපාර අදහස් වේ.

21. පහත දැක්වෙන්නේ ව්‍යාපාර බාහිර පරිසරයට අයත් සාධක අදාළ සාධක කිහිපයකි.

A - නීතිරීති අණපනත්.
B - පොලී අනුපාත.
C - රාජ්‍ය ප්‍රතිපත්ති.
D - වැටුප් අනුපාත
E - මිල මට්ටම.

මේ අතුරින් ආර්ථික පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

i. A, B හා D
ii. B, D හා E
iii. B, C හා D
iv. C, D හා E

22. රෙදි සෝදන සබන් කැටයකට සුවඳ කැවීමෙන් රෙදිවලට සුවඳ එකතු කිරීමට සැලැස්වීම

i. හර නිෂ්පාදිතයකි.
ii. සත්‍ය නිෂ්පාදිතයකි.
iii. වැඩි දියුණු කළ නිෂ්පාදිතයකි.
iv. නිර්මාණශීලී නිෂ්පාදිතයකි.

23. ඇසුරුමක් සහිතව බොහෝ භාණ්ඩ වර්තමානයේ වෙළෙඳපොළට ඉදිරිපත් කෙරේ. ඇසුරුමක අභිලාෂය වන්නේ

i. පාරිභෝගිකයන් ආකර්ශනය කර ගැනීම ය.
ii. භාණ්ඩයේ ආරක්ෂාව ය.
iii. ඇසුරුම නැවත ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වීම ය.
iv. තරඟකාරී භාණ්ඩවලින් වෙන් කොට හඳුනාගැනීම ය.

24. පාරිභෝගිකයාගේ මිලදීගැනීමේ ක්‍රියාවලියට අදාළ පියවර කිහිපයක් පහත දැක්වේ.

A - තොරතුරු සෙවීම
B - වුවමනා හඳුනා ගැනීම
C - මිලට ගැනීම තීරණය කිරීම
D - තොරතුරු ඇගයීම
E - මිලට ගැනීමෙන් පසු චර්යාව

මෙම ක්‍රියාවලිය අනුපිළිවෙලින් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න

i. A, B, C, D හා E
ii. B, A, D, C හා E
iii. B, A, C, D හා E
iv. B, C, A, D හා E

25. ප්‍රධානියා වෙනුවෙන් තමාගේ පෞද්ගලික නාමයෙන්ම වෙළෙඳ ගනුදෙනුවලට සම්බන්ධ
i. කොමිස් නියෝජිතයා ය.
ii. කැපකරු නියෝජිතයා ය.
iii. තැරැව්කරු ය.
iv. ප්‍රේරක නියෝජිතයා ය.

26. "රු. 1000 ට වැඩි ප්‍රාග්ධනයක් යොදා ආරම්භ කරන ව්‍යාපාර ලිඛිතව පවත්වාගෙන යා යුතුය" . මෙයට අදාළ වන්නේ

i. හවුල් ආඥා පනතයි.
ii. සමාගම් පනතයි.
iii. වංචා වැළැක්වීමේ ආඥා පනතයි.
iv. සමූපකාර පනතයි.

27. සමාගමක අභ්‍යන්තර පරිපාලනයට අදාළ ලියවිල්ල වන්නේ

i. සාංගමික ව්‍යවස්ථාවලිය යි.
ii. සම්මුති සහතිකය යි. .
iii. සමාගම් පනත යි.
iv. අධ්‍යක්ෂ නාමලේඛනය යි.

28. පහත දැක්වෙන්නේ ගිණුම්කරණයට අදාළ කාර්යයන් කීපයකි.

A - වාර්තා කිරීම

B - තොරතුරු රැස්කිරීම

C - සාරංශ කිරීම

D - වර්ග කිරීම

මෙම කාර්යයන් අනුපිළිවෙලින් දැක්විය හැක්කේ

i. B, A, C හා D ලෙසය.
ii. A, B, C හා D ලෙසය.
iii. B, C, A හා D ලෙසය.
iv. B, A, D හා C ලෙසය.

29. **ජංගම නොවන වත්කමක් වැඩි වී, ජංගම වත්කමක් අඩු කෙරෙන** ගනුදෙනුවක් වන්නේ

i. රු. 50,000ක් වටිනා යන්ත්‍රයක් ව්‍යාපාරයට මිලදී ගැනීම ය.
ii. රු. 25,000ක බැංකු ණයක් ව්‍යාපාරයට ලබාගැනීම ය.
iii. රු. 5,000ක් වටිනා භාණ්ඩ තොගයක් මිලදී ගැනීමය.
iv. රු. 10,000ක් වටිනා ලී බඩු තොගයක් අමල්ගෙන් ලබාගැනීම ය.

30. බිම්සර තමාගේ ව්‍යාපාරය සඳහා රු.25,000ක් වටිනා භාණ්ඩ තොගයක් දම්සරගෙන් ලබාගන්නා ලදී. ඉහත ගනුදෙනුව සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය වන්නේ

i. ලදුපත ය.
ii. ගැනුම් ඉන්වොයිසි ය.
iii. වවුචරය .
iv. විකුණුම් ඉන්වොයිසිය ය.

31. සෑම ව්‍යාපාර ආයතනයකම දිගුකාලීන අපේක්ෂා දක්නට ලැබේ. දිගුකාලීන අපේක්ෂාලෙස සලකන්නේ

i. පරමාර්ථ ය.
ii. අරමුණ ය.
iii. නිෂ්ඨාව ය.
iv. සැලැස්ම ය.

32. නිෂ්පාදකයෙකු විසින් සිසිල් බීම වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම සඳහා අඛණ්ඩව නිෂ්පාදනය කිරීම

i. කාණ්ඩ නිෂ්පාදනයයි.
ii. ඇනවුම මත නිෂ්පාදනයයි.
iii. ප්‍රවාහ නිෂපාදනයයි
iv. ක්‍රියාවලි නිෂ්පාදනයයි.

33. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතිවලට අනුව භාණ්ඩ නිෂ්පාදනය කර ඇති බවට සහතික කරන්නේ

i. ISO සහතිකය යි.
ii. තත්ව සහතිකය යි.
iii. ගුණත්ව සහතිකය යි.
iv. SLS සහතිකය යි.

34. ව්‍යාපාරයක් පවත්වගෙන යාමේදී එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා අරමුදල් අවශ්‍ය වේ. එය හැඳින්වෙන්නේ

i. ප්‍රාග්ධනය ලෙස ය.
ii. අමතර ප්‍රාග්ධනය ලෙස ය.
iii. කාරක ප්‍රාග්ධනය ලෙස ය.
iv. ස්ථාවර ප්‍රාග්ධනය ලෙසය ය.

35. මානව සම්පත් සැළසුම්කරණ ක්‍රියාවලියට අදාල පියවරයන් පහත දැක්වේ.

A - මානව සම්පත ඇස්තමේන්තු කිරීම
B - මානව සම්පත සඳහා වන අනාගත ඉල්ලුම පුරෝකථනය කිරීම
C - බඳවා ගැනීම සඳහා අදාළ ක්‍රියා මාර්ග ගැනීම
D - ශ්‍රම ඉල්ලුම හා සැපයුම සසඳා ඌණතාව හෝ අතිරික්තය නිගමනය කිරීම
E - සැලසුම් සකස් කිරීම

මේවා නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. E, A, D, B, C
ii. B, A, D, C, E
iii. B, A, E, D, C
iv. B, A, C, E, D

- **ප්‍රශ්න අංක 36 සිට ප්‍රශ්න අංක 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත සිද්ධිය උපයෝගී කර ගන්න.**

පියල් ලී බඩු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා තමා සතු රු. 200,000ක් වටිනා ගොඩනැගිල්ල භාවිත කිරීමටද රු 50,000 ක් වටිනා යන්ත්‍රයක් මිලදී ගැනීමටද අදහස් කරයි.
අපේක්ෂිත **මාසික නිෂ්පාදන වියදම** පහත දැක්වේ.

| | රු. |
|---|---|
| දැව සඳහා | 50,000 |
| වඩු කාර්මික වැටුප් | 20,000 |
| මෝස්තර නිර්මාණයට | 5,000 |
| වර්ණක සහ වැලි කඩදාසි | 2,500 |
| මුරකරු වැටුප් | 5,000 |
| යන්ත්‍ර ක්ෂය | 500 |

**මාසික අපේක්ෂිත නිෂ්පාදනය** අල්මාරි 10 කි.

36. පියල්ගේ ව්‍යාපාරයේ ආරම්භක ස්ථාවර ප්‍රාග්ධනය

i. රු. 50,000 කි.
ii. රු. 150,000 කි.
iii. රු. 250,000 කි.
iv. රු.300,000 කි.

37. අල්මාරි සඳහා අපේක්ෂිත මුළු පිරිවැය

i. රු.75,000 කි.
ii. රු.83,000 කි.
iii. රු.133,000 කි.
iv. රු.333,000 කි.

38. එක් අල්මාරියක අපේක්ෂිත නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

i. රු. 7,500 කි.
ii. රු. 7,550 කි.
iii. රු. 8,300 කි.
iv. රු. 13,300 කි.

39. අපේක්ෂිත පොදුකාර්ය පිරිවැය

i. රු. 5,000 කි.
ii. රු. 5,500 කි.
iii. රු. 7,500 කි.
iv. රු. 8,000 කි.

40. වඩාත් ලිහිල් කොන්දේසි හා සුරැකුම් මත මූල්‍ය ආධාර ඉතා කුඩා ව්‍යාපාරවලට ලබා දීම සඳහා ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමය හැඳින්වෙන්නේ

i. ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය ලෙසය.
ii. ධීවර ණය යෝජනා ක්‍රමය ලෙසය.
iii. මූලික ණය යෝජනා ක්‍රමය ලෙසය.
iv. ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය ලෙසය.

(එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40)

**සියළුම හිමිකම් ඇවිරිණි.**

**2014 සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය**

**පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**II පත්‍රය**

1. උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
2. පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් **ප්‍රශ්න හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
3. පළමු ප්‍රශ්නයට **ලකුණු 20ක්** හා සෙසු ප්‍රශ්න සඳහා **ලකුණු 10** බැගින් හිමිවේ.

---

**01.** දිමුතු පෙරේරා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් පසුව බේකරි කර්මාන්තය පිළිබඳ වෘත්තීය පාඨමාලාවක් හැදෑරීය. ඉන්පසු ප්‍රමුඛ පෙළේ හෝටල් සමාගමක බේකරියේ ආහාර සකසන්නෙකු ලෙස වසර තුනක් සේවය කර ඉන් ඉවත් වූයේ තමාගේම ව්‍යාපාරයක් ඇරඹීමේ අදහසිනි. ව්‍යාපාර සැලැස්ම ඔහුටම පිළියෙල කළ හැකි වූයේ හැදෑරූ වෘත්තීය පාඨමාලාවේ ඒ පිළිබඳ දැනුවත් කිරීම් ද ඇතුළත්ව තිබූ හෙයිනි.
2012.01.01 දින "දිමුතු බිස්කට්" නමින් තම ව්‍යාපාරය ලියාපදිංචි කළේ ලංකාවේ ප්‍රමුඛතම බිස්කට් නිෂ්පාදකයෙකු වීමේ අදිටනින් යුතුවය.

2012.01.01 දින තමන් සතු වූ රු. 300,000ක මුදලක් ද රු.100,000 වටිනා තම යතුරු පැදිය ද ඔහු ව්‍යාපාරයට යෙදවීය. එදිනම ව්‍යාපාරයට අවශ්‍ය තවත් අරමුදල් සපයා ගැනීමට 12% පොළියට රු. 50,000ක බැංකු ණය මුදලක් ලබා ගෙන ව්‍යාපාරයට යොදවන ලදී.

පළමුවෙන් ව්‍යාපාරයට ආසන්න ප්‍රදේශවල පිහිටි පාසල් ආපනශාලා ඉලක්ක කර ගෙන බිස්කට් නිෂ්පාදනය කළ ඔහු ඒවා 1Kg ඇසුරුම් වශයෙන් වෙළෙඳපොළට ඉදිරිපත් කළේය.

ජනවාරි මාසය තුළ ව්‍යාපාර කටයුතු සාර්ථකව කරගෙන ගිය අතර 2012 ජනවාරි මාසය අවසානයේ පහත සඳහන් ගිණුම් ශේෂ දැකගත හැකි විය.

| | (රු.) |
|---|---|
| යතුරු පැදිය | 95,000 |
| උපකරණ | 200,000 |
| ණයගැතියෝ | 10,000 |
| තොගය | 115,000 |
| මුදල් ශේෂය | 80,000 |
| බැංකු ණය | 45,000 |

i. ඉහත සිද්ධිය අනුව දිමුතු සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

ii. දිමුතුගේ ව්‍යාපාරයේ දැක්ම කුමක්ද?

iii. ව්‍යාපාරය ලියා පදිංචි කිරීමෙන් ලැබෙන **ප්‍රතිලාභ දෙකක්** සඳහන් කරන්න.

iv. ව්‍යාපාර සැලැස්මක් පිළියෙළ කිරීමෙන් ව්‍යාපාරයකට අත්වන **ප්‍රයෝජන දෙකක්** සඳහන් කරන්න.

v. ඉලක්ක වෙළෙඳපොළක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

vi. **ජනවාරි 01** දිනට මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධනය කොපමණ ද?

vii. **2012 ජනවාරි 01 දිනට** පැවති මුළු වත්කම්වල අගය කොපමණ ද?

viii. **2012 ජනවාරි 31** දිනට ස්ථාවර වත්කම්වල අගය කොපමණ ද?

ix. **2012 ජනවාරි 31** දිනට ජංගම වත්කම්වල අගය කොපමණ ද?

x. **2012 ජනවාරි 31** දිනට මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධනය කොපමණ ද?

(මුළු ලකුණු 02 × 10 = 20යි)

**02.** "ව්‍යවසායකත්වය යනු අවදානම් සහිත ව්‍යාපාරික අවස්ථාවක් ග්‍රහණය කර ගැනීමෙන් නව නිපැයුම් බිහි කිරීමේ ශක්තියයි."

i. කාන්තාවන් ව්‍යවසායකත්වයට යොමු වීම තුළින් ඔවුන් විවිධාකාර දායකත්වයන් සපයයි. එසේ දායකත්වය සපයන අංශ **හතරක්** සඳහන් කරන්න.

ii. සමාජයීය ව්‍යවසායයන් සඳහා ව්‍යවසායකයින්ට මූල්‍ය ප්‍රතිලාභ හිමි නොවුණ ද වෙනත් ප්‍රතිලාභ හිමි වේ. එවැනි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

iii. මෑතක සිට ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාරවලට යොමු වීම වැඩි වෙමින් පවතී. එවැනි ව්‍යාපාර **හතරක්** සඳහන් කරන්න.

iv. සාර්ථක ව්‍යවසායකයෙකු වීම සඳහා බලපාන සුවිශේෂී පෞරුෂ ගති ලක්ෂණ **හතරක්** නම් කරන්න.

v. ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා රජයක් විසින් විවිධ පහසුකම් ලබා දේ. එවැනි පහසුකම් **හතරක්** නම් කරන්න.

(මුළු ලකුණු 02x5 = 10)

**03.**

i. ව්‍යවසායකයෙකු විවිධ භූමිකාවල නිරත වේ. එම භූමිකා **දෙකක්** නම් කරන්න.

ii. ව්‍යාපාර ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන් නිෂ්පාදන සහ සේවා වශයෙන් වර්ග කෙරේ.මෙය ගැලීම් සටහනක් මගින් ඉදිරිපත් කරන්න.

iii. විද්‍යුත් නොවන සන්නිවේදන ක්‍රම **හතරක්** නම් කරන්න.

iv. ව්‍යවසායකයෙකු අභියෝගවලට මුහුණ දීමේ දී ගොඩනගා ගත යුතු ගුණාංග **හතරක්** සඳහන් කරන්න.

v. ව්‍යවසායකයෙකු තම ඉලක්ක සපුරා ගෙන එකම අරමුණක කණ්ඩායම යොමු කිරීමට ඔහු සතු හැකියාවන් **දෙකක්** නම් කරන්න.

(ලකුණු 02x5 = 10යි)

**04.**

i. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා පොදුවේ භාවිතා කරන ප්‍රමාණාත්මක නිර්ණායක **දෙකක්** සහ ගුණාත්මක නිර්ණායක **දෙකක්** සඳහන් කරන්න.

ii. ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු කිහිපයකි. ඉන් **හතරක්** සඳහන් කරන්න.

iii. පහත සඳහන් ව්‍යාපාර ආරම්භ කිරීම උදෙසා බලපත්‍ර ලබා ගත යුතු ආයතන නම් කරන්න.

(අ) ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම
(ආ) ඉංග්‍රීසි බෙහෙත් වෙළෙඳසැලක් ආරම්භ කිරීම

iv. ව්‍යාපාරිකයින්ට ඇති වන මූල්‍ය දුෂ්කරතා මග හරවා ගැනීම උදෙසා කල්බදු පහසුකම් ආකාර දෙකකින් සැපයේ. එම ආකාර **දෙක** නම් කරන්න.

v. මානව සම්පත පිළිබඳව අධ්‍යයනයේ දී සමාජ විද්‍යාත්මක සාධකය ද සැලකිල්ලට ගැනේ. මෙම සාධකයට අයත් උප සාධක **හතරක්** නම් කරන්න.

(මුළු ලකුණු 02x5 = 10)

**05.**

i. "වර්තමාන ආදායමෙන් වර්තමාන පාරිභෝජනය සඳහා නොයොදන ප්‍රමාණය ඉතුරුම් ලෙස සැලකේ"

(අ) රටක ඉතුරුම් සිදු කරන ප්‍රධාන අංශ කිහිපයකි. ඉන් **දෙකක්** සඳහන් කරන්න.

(ආ) "ව්‍යාපාර ආයතනවලට බලපෑම් ඇති කරන ප්‍රබල සාධකයක් වන්නේ ඉතුරුම්ය." මෙයට හේතුව කුමක් ද?

ii. ව්‍යාපාර අවස්ථාවක් යනු කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. නිෂ්පදිතයක් මිල කිරීමේ ව්‍යාපාරික පරමාර්ථ කිහිපයකි. ඉන් **දෙකක්** සඳහන් කරන්න.

iv. "සෘජු අළෙවිය", ප්‍රවර්ධන මිශ්‍රයේ උපාංගයකි. මෙයට අදාළ අනෙකුත් උපාංග සඳහන් කරන්න.

v. (අ) පහත ලක්ෂණ අඩංගු ව්‍යාපාර සංවිධාන ක්‍රමය කුමක්දැයි නම් කරන්න.

(a) අවම සාමාජික සංඛ්‍යාව දසදෙනෙකි. ලියා පදිංචිය අනිවාර්ය වේ. (ල. ½ )

(b) උපරිම සාමාජික සංඛ්‍යාව පනහකි. ලියා පදිංචිය අනිවාර්ය වේ. (ල. ½ )

(ආ) ශ්‍රී ලංකාවේ බොහොමයක් ව්‍යාපාර කේවල ස්වාමී ව්‍යාපාර වුවද මෙම ව්‍යාපාර ක්‍රමයේ දැකිය හැකි අවාසිදායක ලක්ෂණ කිහිපයකි. ඒවායින් **දෙකක්** සඳහන් කරන්න.

(මුළු ලකුණු 02x5 = 10යි)

**06.** (අ) වමෝදි, 2014.01.01 දින, පාසල් උපකරණ හා පොත් අළෙවිසැලක් ඇරඹුවාය. පළමු දින තුන තුළදී පහත ගනුදෙනු සිදු කරන ලදී.

| | |
|---|---|
| ආරම්භ කිරීමට මුදල් යෙදුවා | රු. 75,000 |
| පොත් හා පාසල් උපකරණ මිලදී ගත්තා | රු. 25,000 |
| ලී බඩු හා උපකරණ මිලදී ගත්තා | රු. 10,000 |
| ගුණසේන සමාගමෙන් පොත් ණයට ගත්තා | රු. 8,000 |
| ගුණසේන සමාගමට මුදල් ගෙව්වා | රු. 5,000 |
| වමෝදි තම පෞද්ගලික ප්‍ර යෝජනය සඳහා පොතක් ගත්තා | රු. 500 |

i. ඉහත එක් එක් ගනුදෙනුව ව්‍යාපාරයේ, "වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්" යන ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.

ii. පළමු දින තුන අවසානයේ දී මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය දැක්වෙන ආකාරය පෙන්වන්න.

(ආ) අවලගේ ව්‍යාපාරයේ 2013.12.31 දිනට ශුද්ධ ලාභය ගණනය කිරීමෙන් පසු ගිණුම් ශේෂ පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| ශුද්ධ ලාභය | 75,000 | ප්‍රාග්ධනය | 113,000 |
| ඉඩම් හා ගොඩනැගිලි | 150,000 | ලී බඩු උපකරණ | 50,000 |
| ණයගැතියෝ | 13,000 | ණය හිමියෝ | 10,000 |
| 8% බැංකු ණය | 40,000 | ගෙවිය යුතු පොළී | 2,000 |
| අත ඉතිරි මුදල් | 20,000 | | |
| 2013.12.31 බඩු තොගය | 7,000 | | |

2013.12.31 දිනට අවලගේ ව්‍යාපාරයේ ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

(මුළු ලකුණු 10)

**07.** කැළුම් විසින් 2015 ජනවාරි 01 දින ''කැළුම් කොම්''නමින් සන්නිවේදන පහසුකම් සපයන ව්‍යාපාර ආයතනයක් නගරයේ ආරම්භ කිරීමට අදහස් කරයි. මේ සඳහා රු. 10,000ක මාසික කුළියට ව්‍යාපාරික ස්ථානයක් ලබා ගැනීමටත් 12% වාර්ෂික පොළියට රු. 200,000 බැංකු ණයක් ලබා ගැනීමටත්කැළුම් අපේක්ෂා කරයි. ජනවාරි මාසය සඳහා ඇස්තමේන්තු කළ වියදම් ඇස්තමේන්තුව මෙසේය.

| | |
|---|---|
| උපකරණ හා අනෙකුත් යන්ත්‍ර | රු. 80,000 |
| මාසික විදුලි බිල | රු. 2,500 |
| මාසික වෙනත් වියදම් | රු. 8,000 |

මාසිකව රු. 15,000 බැගින් ගෙවා සේවකයන් දෙදෙනෙකු බඳවා ගැනීමට ද, මාසක සන්නිවේදන ආදායම රු. 60,000ක් ලෙස ද ඇස්තමේන්තු කර ඇත.

උපකරණ පිරිවැයෙන් 6% බැගින් වාර්ෂිකව ක්ෂය කිරීමද ජනවාරි මාසය සඳහා බැංකු ණය හා පොළිය රු. 8,700ක් ගෙවීම ද කළ යුතු වේ.

i. **2015 ජනවාරි** මාසය සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරන්න.

ii. **2015 ජනවාරි 31 දිනෙන් අවසන් මාසය** සඳහා ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න. (මුළු ලකුණු 10)